# සුවඳ සබන් ඇඟ ගාගෙන

## දේශපාලනයෙන් කලාව හා ජීවිතය සොයා යාම.......



**විජේරත්න පතිරාජ**

**ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හිටපු ප්‍රධානී / ජාතික නාට්‍ය අනුමණ්ඩලයේ සාමාජික / කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ බාහිර කථිකාචාර්ය**

දේශීය නාට්‍ය සම්ප්‍රදායක් ගොඩනැගීමේදී නිරන්තරව අපගේ දේශජ උරුමයන් ගවේශණාය කිරීමත්, අපට ආවේණික වූ ශෛලීන් හා රංග ශිල්ප මතු කරගත හැකි ජන කතා, පුරාවෘත්ත, පූජා විධි ඇසුරු කිරීමත් අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි. 1956 මනමේ බිහිවීමෙන් පසු වරින්වර නාට්‍ය කලාවේ මෙවැනි නව අත්හදාබැලීම් සඳහා තරුණ නාට්‍යවේදීන්ගෙන් ලැබුණු දායකත්වය සුළුපටු නොවේ. 1980 දශකයේ එවන් ගමන් මගක් මත තම ප්‍රතිභාව ප්‍රදර්ශනය කළ තරුණ නාට්‍යකරුවෙක් ලෙස ජනක් ප්‍රේමලාල් කලාකරුවාගේ නමද යොවුන් නාට්‍ය ඉතිහාසයේ සනිටුහන් වී ඇත.

1984 දී ඔහු නිර්මාණය කළ අබුද්දස්ස කෝලම නාට්‍යය යෞවන සම්මාන හතක් දිනාගැනීමට සමත් විය. 1988 දී රාජ්‍ය නාට්‍ය උළෙලට ඉදිරිපත් කළ ඔහුගේ රාජකපුරු නාට්‍යය හොඳම ස්වීය රචනය තුන්වෙනි ස්ථානය ලෙසත්, රංග වින්‍යාසය හා රංග වස්ත්‍ර සඳහා පළමු ස්ථානයත් හිමිකර ගැනීඹට සමත්වීම වැදගත්කොට සැලකිය යුත්තකි. එයින් නොනැවතී රාජකපුරු නාට්‍යය දිවයිනේ විවිධ ප්‍රදේශවල දර්ශන වාර එක්දහස් හයසිය ගණනක් පුරා වසර විසි නවයක් ඉක්මවා අදටත් ප්‍රේක්ෂක ප්‍රතිචාර නොඅඩුව ලබමින් ඉදිරියට යාමත් සුවිශේෂ ජනතා සම්මානයක් ලෙස සිතිය හැකිය. මෙම ජයග්‍රහණයට බොහෝ දුරට හේතුවෙන් ඔහුගේ නාට්‍ය ආකෘතිය අප ජන ජීවිතයේ හද ගැහෙන රිද්මයට ලංවූ සරල ගැමි කතා පුවතක් වටා අපගේ බලි තොවිල් හා පූජාකර්ම වල රිද්මයත්, එම ශෛලියත් ග්‍රහණය කොට ගෙන කළ නිර්මාණයක් වීම නිසා යැයි මගේ හැඟීමයි. මෙම නාට්‍යය ජන සංස්කෘතිය අගයන ජපානය වැනි ඈත පෙරදිග රටකත්, සිංහල ජනසමූහයක් වෙසන ඕස්ට්‍රේලියාවේත් රංග ගත කිරීමට තෝරාගෙන තිබීමද එහි ප්‍රතිඵලයකැයි සිතේ.

නාට්‍ය කලාව රටේ ස්වල්ප දෙනෙකුට පමණක් සීමාවිය යුත්තක් නොවේ. රාජ්‍ය සම්මානයට පත්වන බොහෝ නාට්‍ය තවමත් අගනුවර රංග භූමියට පමණක් සීමාවනු දැක්ම නාට්‍ය කලාවේ ඛේදවාචකයකි. නාට්‍ය සංස්කෘතියක් ඇති කිරීමේදී අප විසින් පළමුව කළ යුත්තේ නාට්‍ය කලාව පිළිබඳ මහජනතාව තුළ ආශාවක් ප්‍රබෝධයක් ඇති කිරීමය. විශේෂයෙන් ම විනාදායන මාර්ග අඩු ගම්දනව්වල අහිංසක ජනතාවට මානසික විශ්‍රාන්තියක් ලබාගැනීමට හැකිවන පරිදි නාට්‍ය කලාව ජනතා සංග්‍රහයක් විය යුතුය. ඉහළ පෙලේ අපභ්‍රංස නාට්‍ය අනුවර්තනය කිරීමෙන් හෝ පරිවර්තනය කර පෙන්වීමෙන් එය එක්වර කළ හැක්කක් නොවේ. ඔවුනට උරුම ලෝකය පළමුව විවෘත කළ යුතුය. මහාචාර්ය සරත්චන්ද්‍රයන් රත්තරං, එලොව ගිහින් මෙලොව ආවා, කදාවළලු, හස්තකාන්ත මන්තරේ, ඒකට මට හිනා හිනා, වෙල්ලවැහුම් වැනි නාට්‍ය නිශ්පාදනය කිරීමෙන් හෙළි පෙහෙළි කළේ එවන් මගකි. එමගින් විශේෂයෙන්ම පොදු ගැමි ජනතාවටත් ළමා පරපුරටත් නාට්‍ය රසය ජනනය කිරීමට කළ හැකි පෙළඹුම සුළුපටු නොවේ. ජනක් ප්‍රේමලාල් ගේ රාජකපුරු නාට්‍යය ගම්දනව් සිසාරා එවැනි ප්‍රවණතාවක් ඇතිකළ බව පිළිගත යුත්තකි. රාජකපුරු නාට්‍යයේ කථා වස්තුව සරලය. ගැමි කතාවක් අපූර්වත්වයට පත් කරමින් කළ එම නිර්මාණය තුළ සැඟවී ඇති තේමාව ප්‍රබලය. ග්‍රීක නාට්‍ය කලාවේ සිට අද දක්වා නාට්‍ය කරුවනට පාදක වූ "රාජ්‍ය බල ලෝභය" ඉතා සියුම් ලෙසත් කර්කශ ලෙසත් උපහාසයට ලක් කරන්නේ අපේ පැරණි කෝලම් නාට්‍යකරුවාගේ පරිහාස ආකෘතිය යොදා ගැනීමෙනි. පඹයා රජවීම ප්‍රේක්ෂකයා විඳින්නේ උත්ප්‍රාස රසයක්, හාස්‍ය රසයත් නොඅඩුව වැළඳ ගනිමිනි. ගැඹුරු ප්‍රශ්නයක් ගෙන නොතේරෙන තර්කවලින් හෙම්බත්කිරීම ගැමි කලාවක ලක්ෂණයක් නොවේ. තමාට හුරුපුරුදු වටපිටාවක් තුළ ජීවත්වෙමින් අහිංසක වින්දනයක් ලබාගැනීමටත්, එමගින් මනුෂ්‍ය ස්වභාවය තේරුම් ගැනීමටත් අවස්ථාවන් මතුකර තිබීම මෙම නාට්‍යය ගැමි ප්‍රසාදයට හේතු වූ තවත් කරුණකැයි සිතේ.

ජනක් ප්‍රේමලාල් නාට්‍ය නිර්මාණ වන රාජකපුරු සහ අබුද්දස්ස කෝලම පිය පුතු සම්මාදමක නිර්මාණ දායකත්වයක් ලබා තිබීම ද අපූර්ව සිදුවීමකි. පියා නාට්‍ය රචකයාය. ඒ සිරිසේන ප්‍රේමලාල් නම් කලාකරුවාය. නිශ්පාදක ජනක් ප්‍රේමලාල්ට මෙම නිර්මාණ හරහා නවක නළු නිළි පිරිසක් හඳුන්වාදීමට හැකිවීමද වැදගත් කරුණකි.

දේශපාලනය ඉතා අමිහිරිය. බොහෝ නාට්‍යවල දී මේ අමිහිරි දේශපාලනය තවත් අමිහිරි බවට පත් වේ. එහෙත් බොහෝ අය මේ අමිහිරි දේශපාලනයට මෙන්ම දේශපාලනය අන්තර්ගතය කරගත් මේ අමිහිරි නාට්‍ය වලටද කැමැත්තක් දක්වති. එහෙත් රාජකපුරු නාට්‍යයේ දී මේ දේශපාලනය මිහිරි නාට්‍යයක් බවට පත් වේ. එයට හේතුව එහි රචකයා දේශපාලඥයෙකු නොව කලාකරුවකු වීමය.

රාජකපුරු නාට්‍යයේදී සිදුවන්නේ කලාකරුවකුගේ දෘෂ්ඨියෙන් දේශපාලනය විවරණය කිරීමයි. එහෙත් රාජකපුරු නාට්‍යයේ ඇත්තේ කලාකරුවකුගේ දෘෂ්ඨිය පමණක් නොවේ. නැටුම්, ගැයුම්, වැයුම්, සාහිත්‍යමය දෙබස් ආදී කලාවේ සියලු අංගෝපාංග එහි වේ. එනම් රාජකපුරු නාට්‍යයේ දී සිදුවන්නේ කලාව තුලින් දේශපාලනය විවරණය කිරීමයි.

රාජකපුරු නාට්‍යය පඹයකු රජ වීමේ කතා පුවතක් ලෙස සරල කල යුතු නොවේ. එවන් සරල දේශපාලන කතාවකට රාජකපුරු කොටු නොවේ.

වැඩක් නැති රජකමට වඩා කෙතෙක් රකින පඹයකු වීම යහපත් පව නම් නාට්‍යයෙන් කියැවේ. රාජකපුරු නාට්‍යයේ ඇතු දණ ගහන්නේ හේනේ කුරුල්ලන් එළවීමට සිටුවා ඇති පඹයකු ඉදිරියේය. එසේ වූ පසුව පඹයා රජවේ. එහෙත් පසුව ගොවියා හොරෙන් රජ මාළිගාවට පැමිණ තමාගේ හිතවත් රජ වූ පඹයා ආපසු රැගෙන යයි.

ගොවියා සිතන්නේ මෙසේ නිකරුණේ බොරුවට රජවීමට වඩා හේනේ කුරුල්ලන් එළවීම පඹයාට හොඳ බවය. ඇත්තම කතාව නම් තමන්ගෙන් වැඩක් සිදුවන්නේ කොතනද රජකම ඇත්තේ එතනය. නාට්‍යයේ අර්ථය එයයි. ඒ අනුව මේ නාට්‍යයේ සියළු නළුවන් හා ශිල්පීන් රජවරුන් යැයි සිතේ මක්නිසාද යත් තමන්ගේ හැකියාවන්ගෙන් කාටත් වැඩක් වෙන නාට්‍යයක් ඔවුන් රඟපාන බැවිනි.



යහපත් වෙද මහතා ද වෙදකමෙන් රජෙකි. වෙදකමට ද රජෙකි. වෙදකමටද රජෙකි. ගොවියාගේ රජකම ඇත්තේ ගොවිතැනෙහිය. කවියාගේ රජකම ඇත්තේ කවියෙහිමය. එනම් රාජකපුරු පඹයක- රජ වීම පිළිබඳ දේශපාලන කතාවකට වඩා රජකම යනු කුමක්දැයි කියන දාර්ශනික නාට්‍යයකි. රාජකපුරු කාටත් රසවත් නාට්‍යයක් වන්නේ ඒ නිසාය.

ජීවිතයෙන් දේශපාලනය වෙත යාම නොව දේශපාලනයෙන් ජීවිතයත් සාහිත්‍යයත් සොයා යෑම රාජකපුරු නාට්‍යයේදී සිදු වේ.

කලා රස වින්දනය පිළිබඳ අපේ අදහස ශෝකයෙන් රසය උපදින යැයි බවය. එහෙත් එසේ නම් කලාවේ හා සාමාන්‍ය ජීවිතය අතර වෙනසක් නැත. එනම් ජීවිතයේදී අද ශෝක වන බැවිනි. එයින් රසයක් ද ලබන බැවිනි. එහෙත් කලාවේ දී ශෝකය උපදින්නේ රසය තුළිනි. සිනාව, සතුට හා අවබෝධය උපදින්නේ රසය තුළිනි. මේ බව මා දැනගත්තේ ද රාජකපුරු නාට්‍ය නැරඹීමෙනි.

මේ අනුව රාජකපුරු කලාව මෙස් විය යුතු යැයි ද කියන නාට්‍යයකි.

මේ නාට්‍යයේ පිටපතට අධ්‍යක්ෂවරයාගෙන් නළුවන්ගෙන් හා සංගීතයෙන් ලැබෙන ජවය ඉමහත්ය.

රවීන්ද්‍රගේ රංගනය ගැන කිව යුතු නැත. සුවඳ සබන් ඇඟ ගාලා ගායනා කරන අයුරු අමුතුවෙන් විස්තර කළ යුතු නැත. එසේම එයට සරත් කුලාංග යොදා ඇති සුවඳ වෑහෙන තනුව ගැන ද කිව යුතු නැත. එයට සද්ධා උත්පලකන්දගේ නිර්මාණය කර ඇති සුවඳ වෑහෙන නැටුම ගැන ද අමුතුවෙන් කිව යුතු නැත.

මේ නාට්‍යයට දැනට වසර විසිනවයක පමණ අතීතයක් හිමිය. එහි මංගල දර්ශනයේ රඟපෑ නළුවෝ වසර විසිනවයකින් වයසට ගොස් සිටිති. එහෙත් නාට්‍යය නම් මහළු වී නැත. අවුරුදු විසිනවයක් පරණ රාජකපුරු තවමත් තරුණ නාට්‍යයකි.

රාජකපුරු නාට්‍යයේ ආරම්භයේ තිරය විවර වීමේදී දකින්නට ලැබෙන්නේ රාජ මාළිගයේ දොරටුපාලයාය. ඔහු කියන පළමු වචනය " මළ සේක" යන්නයි. එය මුලදී ප්‍රේක්ෂකයාට ප්‍රහේලිකාවකි. එහෙත් ප්‍රහේලිකාව විසෙඳන්නේ හාස්‍ය රසය ගෙනෙමිනි. එනම් රජතුමා පරලෝසැපත්ව ඇත. "මළ සේක" යැයි කීවේ ඒ නිසාය. අපේ ව්‍යවහාරයේ පවතින "මළ සේක" නම් අමුතු වචනය නිර්මාණාත්මක ලෙසින් "රාජකපුරු" නාට්‍යයට එක් වන්නේ එසේය. අපේ භාෂාවේ රමණීයත්වය ඉතා උසස් අන්දමින් රස ජනනය සඳහා භාවිතා කිරීම රාජකපුරු නාට්‍යය පුරා දැකිය හැකිය.